# ඩී. ඇස්. සේනානායක මහතාගේ කෘෂි කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ වචනයක්

*සාකච්ඡා කර සකස් කරන ලද්දේ එස්. ආර්. බණ්ඩාර විසිනි*

මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාර තැන්පත් ගරු පී. සී. ඉඹුලාන මහතා සමග කරන ලද සාකච්ඡාවක් ඇසුරෙන් මේ ලිපිය සකස් වේ - සංස්කාරක.

ප්‍රශ්නය:

ආණ්ඩුකාර තුමා දන්නා පරිදි ගරු ඩී. ඇස්. සේනානායක මහතා ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ සංවර්ධනය උදා කිරීම සඳහා කරන ලද කාර්යයන් මොනවාද?

පිළිතුර:

1931 දී බ්‍රිතාන්‍ය පාලනය යටතේ වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවක් ශ්‍රී ලංකාවේ තිබුනේ. එම මන්ත්‍රණ සභාවේ ඒ ඒ විෂය කටයුතු සඳහා කමිටු ක්‍රමයක් තිබුණා. ඒ කාලයේ දේශීය ජනතාව පාලනයට සහභාගි කරවා නොගැනීම නිසා ඊට කෙසේ හෝ සහභාගි වී දේශීය ආර්ථික කටයුතු දියුණුකර ගැනීමටත්, නිදහස ලබා ගැනීමටත් ලාංකිකයන් විශාල උද්යෝගයකින් ක්‍රියා කළා.

ඔය කාලේ ඩී. ඇස්. සේනානායක මහත්මයා රාජ්‍ය මන්ත්‍රණ සභාවට මහජන ඡන්දයෙන් තේරී පත් වුනා. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කෘෂිකර්ම ඇමති ධුරයට ඔහු තේරුනා. කෘෂිකර්ම ඇමතිට කෘෂිකාර්මික කමිටුවේ සභානායක කම හිමිවෙනවා. කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන රජයෙන් (එනම් බ්‍රිතාන්‍ය පාලනයෙන්) ලබා ගැනීමේ හා ඒවා වියදම් කිරීමේ හැකියාව මේ කමිටුව සතුව තිබුනා. ඒ නිසා කෘෂිකාර්මික කටයුතු වැඩි දියුණු කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම තදබල ප්‍රශ්නයක් වුනේ නැහැ.

ඒ කාලෙ අද වගේ රථවාහන, ජීප්ස් ඒ හැටි ගොඩක් තිබුනේ නැහැ. කලාතුරකින් තමයි මෝටර් රථයක් දක්නට ලැබුනේ. බොහෝ දෙනෙක් ගමන් ගියේ අශ්ව කරත්තෙන් , බර කරත්තෙන්, අශ්වයාපිටින් හා පා ගමනින් . ගමනාගමන පහසුකම් ඉතාමත් සීමිතයි, දුෂ්කරයි.

ඒ වගේම ඒ කාලෙ මැලේරියා උණ ඉතා සීඝ්‍රයෙන් රට පුරාම පැතිරී තිබුණා. කෑගල්ල දිස්ත්‍රික්කයේ පමණක් මැලේරියා රෝගීන් 66,000 ක් 1936 දී වාර්තා වෙලා තියෙනවා. මේවා ලෝක සෞඛ්‍ය සංවිධානයේ සංඛ්‍යාලේඛණ වලින් ඔප්පු වෙනවා.

මේ හේතු නිසා ගොවීන් විසින් ගොවිතැන් කටයුතු හා ගොවිපොළවල් අත්හැර ගොස් නටබුන් වෙලා ගිහින් තිබුනේ. ඩී. එස්. සේනානායක තුමා මේ ප්‍රදේශ වලට අශ්ව කරත්තෙන් හා පයින් ගියා. ගිහින් එවැනි නටබුන් වී ගිය වැව් අමුණු හා ගොවිපොළවල් වල ලැයිස්තු සකස් කර ගෙන ඇවිත් ඒවා එකින් එක සංවර්ධනය කරන්න අවශ්‍ය පියවරවල් සැලසුම් කළා. ඊට පසුව ඒ වැව් අමුණු පිළිසකර කිරීමේ කටයුතු ආරම්භ කරල කර ගෙන ගියා. මේ ආකාරයට වැව් අමුණු ශක්තිමත් කරල ගොවිතැන් කටයුතු කර ගෙන යාමට අවශ්‍ය සැම සහයෝගයක්ම දුන්නා.

ප්‍රශ්නය :

ඒ ආකාරයට නායකත්වයක් දෙන්න එතුමාට පුළුවන්කම ලැබුනේ ඔහු සභානායක වෙලා සිටි නිසා ද ?

ඒ නිසා අවශ්‍ය කරන මුදල් රජයෙන් පහසුවෙන් වෙන් කර ගන්න පුළුවන් උනා ද ?

පිළිතුර :

නෑ. පැවැති ඉංග්‍රීසි ආණ්ඩුවෙන් අවශ්‍ය තරමට මුදල් සමහර අවස්ථාවලදී ලැබෙන්නෙ නැතිව ඇති. සමහර අවස්ථාවලදී ලැබෙන්න ඇති. ලැබුනෙ නැහැ'යි කියල එතුමා කිසිවිටකත් පසුබට වුනේ නැහැ. ඒ හැම අවස්ථාවකම බ්‍රිතාන්‍ය පාලකයන් සමග සටන් කරන්න ඩී. ඇස්. සේනානායක මහත්මයා පෙළඹුනා. ඩී. ඇස්. ගෙ ම වචනවලින් මෙය කියනවා නම්, "මුදල් දෙන්න රජය අදිමදි කළාම මට ලොකු හයියක් ආවා. ඒ ගොල්ලොත් එක්ක සටන් කරන්න" යනුවෙනි.

ඒ කාලෙ නිදහස් අධ්‍යාපනයක් තිබුනේ නැහැ. නිදහස් අධ්‍යාපනය ලබා ගත්තේ ලොකු සටනක් කරල. රජය කියනවා පොහොසත් අය අධ්‍යාපනය ලබනවාට මුදල් ගෙවන්න ඕන. දුප්පත් අය මුදල් නොගෙව්වාට කමක් නෑ කියලා. නමුත් එහෙම කරන කොට ලංකාවේ සමාජයේ ඉබේම පංති භේදයක්, ඇති අය හා නැති අය අතර භේදයක්, වර්ධනය වෙනවා. ඩී. එස්. ඒක දුර තියාම දැක්ක. ඔහු ඒ තර්කය එතැනට යොදා ගත්තා. ඔහු රජයට කරුණු පැහැදිලි කරල දුන්නා. නිදහස් අධ්‍යාපනයක් දීමේ වැදගත්කම පොහොසත්, දුප්පත් කියන පරතරයකින් තොරව. මේ වෙලාවේ සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහත්මයාත් සිටියේ විශාල බියකින්, නිදහස් අධ්‍යාපනය රටට ලබා ගන්න බැරිවේ ද කියල. මේ මුදල් පිළිබඳ ප්‍රශ්න නිසා. නමුත් ඩී. එස්. තමයි පෙරමුණ ගත්තෙ මෙතැනදි. "මේ වැඩේට ඉංග්‍රීසි ආණ්ඩුව විරුද්ධයි. ඒ නිසාම අපි මේක කොහොමහරි කරමු" කියල. ඒ අවස්ථාවේ ඔහු විප්ලවකාරී ලෙසින් "නිදහස් අධ්‍යාපනය" යන්න දිනා ගැනීමට තර්ක විතර්ක ගෙනාව. ගෙනල්ල ඉංග්‍රීසි ආණ්ඩුවට කිව්වා පොහොසතුන්ගෙන් ආදායම් බදු අය කර ගන්න, ඔවුන් ගේ ආදායමට අනුව. නමුත් ළමයින්ට නිදහස් අධ්‍යාපනය ලබා දෙන්න කියල. ඒ ආකාරයට නිදහස් අධ්‍යාපන සටන දිනුවා. මේවා එද සමාජයේ අපේ පැවැත්ම ශක්තිමත් කරන ලද ඉතා වැදගත් අවස්ථාවල්.

ඩී. එස්. ගේ කාලෙ වාරිමාර්ග කටයුතු භාර ඉංජිනේරුවරයෙකු වශයෙන් කෙනඩි නම් ඉංග්‍රීසි ජාතික ඉංජිනේරුවෙක් වැඩ කළා. ගොයම් බණ්ඩි අවස්ථාවේදී වැව්වල වතුර සොරොව් ඇරියා කියල ඔහුගේ වැඩ තහනම් කරල, ඔහු පිටරටටම ඇරියා. ඒ වගේ නිර්භීත වැඩ කළ කෙනෙක් ඩී. එස්.

ප්‍රශ්නය :

ඩී. එස්. ජනපද යෝජනා ක්‍රම ඇති කරල වියලි කලාපයේ ගොවි බිම් ගොවීන් අතර බෙද දීමට මහත් උනන්දුවක් දැක් වූ කෙනෙක් වශයෙන් ඔබ ඔහු දකින්නේ කෙසේ ද ?

පිළිතුර :

ඒ කාලෙ තිබුණ ඉඩම් වගා නොකර අපතේ හැරීම් පිළිබඳව ආඥා පනතක්. ඒ කියන්නේ අවු. 10ක් අපි අපේ මුතුන්මිත්තන්ගේ ඉඩම් වගා නොකර පාළුවට ඇරල තිබුනොත් ඒවා ආණ්ඩුව සන්තක කරනවා. ඒ කියන්නේ ඉංග්‍රීසි ආණ්ඩුවට අයිතිකර ගෙන ආණ්ඩුවේ කැමැත්ත පරිදි ඒවා භාවිතා කරනවා. විකුණනවා. ඒ වගේ දේවල් කරනවා. මෙය නතර කිරීම සඳහා එතෙක් පැවති ඉඩම් පිළිබඳ ආඥා පනත් වල අවාසි සහගත තැන් ඉවත් කර අවශ්‍ය සංශෝධනයන් සහිතව ඉඩම් සංවර්ධන ආඥා පනත ඉදිරිපත් කරල ඒ ආකාරයෙන් වැසියන්ගේ ඉඩම් ආණ්ඩුවට පවරා ගැනීම නතර කරවන්න කටයුතු කළා.

ඊට අමතරව "රාජ්‍ය උකස් බැංකුව" කියල බැංකුවක් ඩී. එස්. ආරම්භ කළා. ලාංකික වැසියන්ගේ ඉඩම් පිටරැටියන්ට සින්න වීම වලක්වා ගැනීමේ පරමාර්ථයෙන් තමයි මේ බැංකුව ආරම්භ කළේ. ඒ කාලෙ ඉඩම් හිමි ලාංකිකයන් තමන්ගේ ඉඩම් විදේශකයන්ට උගස් කරල මුදල් ගන්නවා. ඒ සඳහා විශාල පොලියක් අය කළා. පොලිය වැඩි නිසා ගෙවා නිම කර ගන්න අමාරු වී ඉඩම විදේශිකයන්ට සින්න වෙනවා. අන්න ඒ තත්ත්වයෙන් ලාංකිකයා මුදා ගත්තේ මේ බැංකුව පිහිටුවීම තුළින්. බැංකුව විදේශිකයන්ට ගෙවිය යුතු මුදල ගෙවල ඉඩම බැංකුවට පවරා ගන්නවා. ඊට පසු දේශීය ඉඩම් හිමියා බැංකුවට තමන්ගේ හැකි පමණින් කොටස කොටස ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගෙවල තමන්ගේ ඉඩම තමාටම හිමි කර ගන්නවා. මේ ආකාරයට ඉඩම් භුක්තිය වෙනස් කරවන යන්ත්‍රය ආපස්සට කරකවල දේශීය ජනතාවගේ දේපොල, ඉඩකඩම් බේරා දුන්නා. මේවා තමයි හොඳම නීති එදා තිබුණු. මේවා විශාල ජයග්‍රහණ.

ගොවි ජනපද ගැන කථා කරනවා නම්, එතුමා මින්නේරිය, මිනිපේ, තෝපාවැව, ගල්ඔය, කන්තලේ, අල්ලෙයි වගේ ගොවි ජනපද ඇති කළා. ගල්ඔය කියන්නේ ලංකාවේ පවතින වැව් වලින් විශාලම වැව වන පරාක්‍රම සමුද්‍රය යටතේ තිබෙන ජනපද යෝජනා ක්‍රමය. පරාක්‍රම සමුද්‍රයේ බැම්ම හතර වතාවක් කැඩුනා. විටින්විට කැඩි කැඩී ගියා. ඒ බැම් කැඩී යාම නැවැත්වීමට කටයුතු කලේ එතුමා. ඩී. එස්. තමයි වැව භාරව සිටිය ඉංජිනේරුවාට කීවේ බැම්ම කොන්ක්‍රීට් වලින් දාන්න. එතකොට කැඩිල යාම නවතිව් කියලා. ඊට පසුව පරාක්‍රම සමුද්‍රයේ බැම්ම කැඩී යාම නතර වුනා.

ඒ විතරක් නොවෙයි. මේ ජනපද ව්‍යාපාර පිහිටුවීම සැලසුම් කිරීම සඳහා අවශ්‍ය කරන මූලික වැඩකටයුතු සඳහා එතුමා සැතපුම් දහය දොළහ වගේම විස්ස විසිපහ පයින් ගිහින් කැලෑ පීරල දුක් විඳල තියෙනවා. එදා අද වගේ වාහන තිබුනේ නැහැ. ඩී. එස්. ඒව කළේ සිංහලය, දෙමළය, මුස්ලිම්ය කියල වෙනසක් නැතුව. ඒ ජනපද ව්‍යාපාරවල ඒ වන විට සිටි ජනතාව ජාති, කුල, ආගම් භේද වලින් තොරව ඒවායේ පදිංචි කරවා ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය සැම සහයෝගයක්ම දුන්නා. ගල්ඔය ව්‍යාපාරය තමයි ලංකාවේ දේශීය මූල්‍ය ප්‍රතිපාදනයකින් ඉදි කරන ලද විශාලම වැව. ඉදි කිරීම් කටයුතු "තඩ්සන්" කියන ඇමරිකන් සමාගමක් කළා. ඔවුන්ට මුදල් ගෙව්වේ විදේශාධාර වලින් නොවෙයි. දේශීය ආදායම් වලින්. ගල්ඔය වැඩකටයුතු සියල්ලම ඉවර කරල 1956 දී රුපියල් කෝටි 600 ක පමණ මුදලක් ඉතුරු වෙලා තිබිල ආපසු මහා භාණ්ඩාගාරයට දුන්නා. මේ විධියට ඔහු කෘෂිකර්මාන්තයේ දියුණුවට, රට ස්වයං පෝෂණය කිරීමට විශාල සේවයක් කළා. රටවැසියාගේ ජීවන වියදම අඩු කරන්න විශාල මෙහෙයක් හා නොමැකෙන පියවරවල් ගත්තා.

මේ කාලයේ දී මැලේරියාව ශීඝ්‍ර ලෙස පැතිරිලා තිබුණා. රටවල් වලින් මැලේරියාව නැති කර ගත් රටක් ලෙස ලංකාව ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවල්වල සඳහන් වෙනවා. ඒ පිළිබඳව එනම් මැලේරියාව නැති කිරීම සඳහා අවශ්‍ය පියවරවල් ගැනීමේ කීර්තිය සම්පූර්ණයෙන්ම එතුමාට හිමි වෙනවා. මේ කාලයේදීම ඉතාලියේ පෝ ගංගාධාරයේත් මැලේරියාව පැතිරිලා තිබුණා. නමුත් ඒ අයට ඒක නැති කර ගැනීම පහසු වුනේ නැහැ. ලංකාවේ සෞඛ්‍ය කටයුතු ඒ අතින් ඉතා විශිෂ්ඨව පැවතුනා. ඒ බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තා වලින් ඔප්පු වෙනවා. ඒ කාලෙ ගෑණු පිරිමි හැම දෙනාගේම ප්ලීහාව ඉදිමිලා තිබුනේ මේ මැලේරියා උණට ගොදුරු වීම නිසා. මැලේරියාව මර්ධනය වීමත් සමගම මිනිසුන් සාමාන්‍ය තත්ත්වයට පත් වෙලා ඊට පස්සෙ තමයි රටේ ගොවිතැන් කටයුතු සශ්‍රීකත්වයට පත් කර ගන්න පුළුවන් වුනේ. එතුමාගේ වැව් අමුණු පිළිසකර කරවීම් වල හා ශක්තිමත් කිරීම්වල

අවසාන පරමාර්ථය වුනේ වෙන මොකවත් නොවේ. මහවැලියට වතුර ලබා ගන්න අවශ්‍ය වීම. ඒක ඔහුගේ සැලසුම්වල අවසාන මහා පරිමාන අරමුණ

ප්‍රශ්නය :

එතුමාගේ අදහසක් තිබුණා ලංකාව දියුණු කළ යුත්තේ කෘෂිකර්මාන්තය හරහාම පමණයි කියලා. ඒක සත්‍ය ද ?

පිළිතුර :

ඔව්. ඒක ඇත්ත. අල, බතල, වී ටික වගා කර ගන්න ඕනැ නේ. ඉස්සෙල්ලාම කෑම පිහාන සකස් කර ගැනීම තමයි මුලින්ම කළ යුතු කාර්යය. දැන් නම් අපි සියල්ලම පිටරටින් ගෙන්නනවා. කවදහරි එහෙම කරනවා නම් ඒක අපේ දුර්වලකමක්නේ. අපි පිටරටවල් වලින් ගෙන්වන බොහෝ දේවල් මෑතක සිට දියුණු වූ රටවල් වලින් ආනයනය කළ දේවල්. උදා : මැලේසියාව.

ඩී. එස්. ගේ ගොවි ජනපද ව්‍යාපාර ගැන කථා කරන විට මින්නේරිය, මිනිපේ, තෝපා වැව, ගල්ඔය,කන්තලේ, අල්ලෙයි, හිගුරක්ගොඩ වැනි ඒවා අදත් ගොවිතැන් කටයුතු හා සම්බන්ධව වැදගත් තැනක් හිමිකර ගෙන තිබෙන ඒවා.

මේ ගොවි ජනපද යෝජනා ක්‍රමවල වැඩි අවධානය යොමු වුනේ වී වගාව කෙරෙහි වුවත් අනෙක් වගාවල් ගෙවතු වගා, උයන් වගා හා සත්ත්ව පාලනය යන දේවල් අමතක කළේ නැහැ. ගොවීන්ට (ගොඩින් 3යි මඩින් 5 යි ගණනේ) අක්කර අටක් පමණ විශාල වූ ඉඩම් කට්ටි බෙදා දුන් අතර විශාල ගොවිපොලවල් සඳහා ද ඉඩම් වෙන් කරල ඒවායෙ උයන් වගා හා පළතුරු වගාවල් ඇති කළා. උදා : ග්‍රේප් ෆෘට්ස් වැනි පළතුරු විශාල ගොවිපලවල් වශයෙන් වගා කර තිබුණා.

මීට අමතරව කෘෂි පර්යේෂණ මධ්‍යස්ථාන රැසක් ඇති කරන්නට එතුමා මූලික වුනා. සතුන් ඇති කිරීම සඳහා සත්ත්ව ගොවිපොලවල් රැසක් ඇති කළා. උදා : රිදීගම සත්ත්ව ගොවිපොල, ගන්නෝරුව, මහ ඉලුප්පල්ලම, කුණ්ඩසාලේ වැනි කෘෂි පර්යේෂණ මධ්‍යස්ථාන ඔහුගේ අදහස්වල ප්‍රතිඵල. මහා ඉලුප්පල්ලම පර්යේෂණ මධ්‍යස්ථානය අක්කර 3,000 ක් පමණ විශාල එකක් . ඒ ඉඩම් ඉතා නිසරු ඉඩම් වශයෙන් ගම්මු විසින් නම් කරල තිබුණු ප්‍රයෝජනයකට නොගත් ඉඩම්. ඒවා පර්යේෂණ මධ්‍යස්ථානයට පවරා ගෙන පර්යේෂණ කටයුතු වලට යොමු කරල ඒවායෙන් ඉතා වැදගත් එල ප්‍රයෝජන අද වන විට ලබා ගෙන තිබෙනවා. නිසරු බිම් වලින් වුවත් ප්‍රයෝජන ගැනීම ඩී. එස්. ගේ තවත් කැපී පෙනුණු ලක්ෂණයක්.

ඩී. එස්. මුලින්ම අළුත්වැඩියා කළ ඇල යෝධ ඇල. මිනිපේ යෝජනා ක්‍රමය ඇති කරල තියෙන්නේ මේ යෝධ ඇල සංවර්ධනය කිරීම මගින්. එය එවකට එම දිස්ත්‍රික්කය භාරව සිටි දිසාපති වන රඹුක්වැල්ල දිසාවගේ සුපරීක්ෂණය යටතේ ඉදි කෙරුණු අතර, ඉඩම් ගොවීන්ට බෙදා දී ඔවුන් වගාවට උනන්දු කරවනු ලැබුවා. මිනිපේ, මින්නේරිය යන ජනපද යෝජනා ක්‍රම දෙකම අළුත් ඒවා නොවේ. තිබුණ වගා බිම් නැවත සකස් කර යම් නිසි පිළිවෙළකට ගොවිතැන් සඳහා යොදවා ගත් යෝජනා ක්‍රම.

ජනපදිකයන් ලෙස මේවාට තෝරා ගත්තේ සත්‍ය වශයෙන්ම ගොවියෝ. ඔවුන්ට ගොඩින් අක්කර 3ක් හා මඩින් අක්කර 5ක් වශයෙන් බෙදා දුන් අතර කුඹුරු බිම හා ගොඩබිම එකට යාව පිහිටි ඒවා. ගොඩ බිමේ උස් තැනකින් ගේ ඉදි කර ගෙන ලහපාත පිහිටි කුඹුරු බිම අස්වැද්දීමේ සංකල්පය තමයි එතැන දියුණු කරල තිබුනෙ. අද වගේ ලයින් කාමර ක්‍රමයට ගෙවල් යායට හදන්න උපදෙස් දුන්නේ නැහැ. ගේ හදා ගත යුතු තැන ඒ ගොවීන්ට රජයෙන්ම පෙන්නුම් කළා. එපමණක් නොව ඒ ගේ හදා ගන්න අවශ්‍ය කරන සියළුම ආධාර උපකාරත් දුන්නා. ගොවිතැනට අවශ්‍ය ආධාර උපකාරත් දුන්නා. පළතුරු උයන්, කෙසෙල් හා පොල් අල බතල ආදිය ගොඩ බිමේ වගා කළ අතර මඩ බිම වී වගාවට යොමු කළා. ගොවීන් හැම කෙනෙකුටම ඉඩම් අක්කර 8 ට අමතරව ගේ පැලක් සාදා ගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා ආධාර හැරුණු විට මී හරක් බාන් 2 ක්, නගුල් 2 ක්, පෝරු 2 ක්, කෙවිටි දෙකක් උදළු ආදිය සපයා දුන්නා. අද නම් ගෙවල් පේළියට හදා ගන්න කියල තමයි උපදෙස් දෙන්නේ. වතුර හා විදුලිබලය ලබා දෙන්න පහසු ක්‍රමය එයයි කියලයි එහෙම කියන්නේ. ඒත් එදා තත්ත්වය ඊට හාත්පසින් වෙනස්. එදා මැලේරියාව හා වල් අලි කරදර යන දෙකම මේ ප්‍රදේශවල තිබුණා. ඒ නිසා හැදූ ගෙවල් තාවකාලික ගෙවල්. ඒ ගෙවල් විසිරුණු ස්වභාවයට තමයි ඉදිකරල තිබුනේ. රෑට වල් අලින්ගේ කරදරයෙන් මිදීමට මිදුලේ ගිනි ගොඩවල් හදනවා. හැම ගේකම වාගේ ගිනිගොඩවල් හැදුවම ඒවා ඈතින් සිට බලන වල් අලින්ට විසිරී ගිය ආකාරයට පෙනෙනවා. ඔවුන් ගින්දරට භය නිසා ගම්මානයට එන්නේ නැතිව වෙනත් මාර්ග වලින් කැලෑවට යනවා. ඒ ලෙසින් පරිසරයට අනුකූල වන ආකාරයට තමයි ඒ සියළුම දේ එදා එතුමා සැලසුම් කරල තිබුනේ.

ප්‍රශ්නය :

ඒ ජනපදවල ගොවීන් ඉඩම් හැර ගියේ නැද්ද ?

පිළිතුර :

ඒවාට තෝරා ගත්තේ නියම ගොවීන්. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ එම නීති රීති වලට අනුව ඒ ගොවීන් ඉඩම් කච්චේරි මගින් දිසාපති විසින් තෝරා ගත් අය. මුළු රටෙන්ම ගොවීන් ඒ ජනපදවලට පදිංචි කරවීමට තෝරා ගත් අතර දකුණු ප්‍රදේශයෙන් පමණක් ගොවීන් නොවන, නමුත් ගොවිතැනට ආශාවක් ඇති අය තෝරා ගෙන තියෙනවා. ඔවුන් හැමෝම ඉඩම් නැති අය. ඒ ජනපදවල පදිංචියට යන්න කැමති අය. මොන දුකක් විඳගෙන හරි එහේ ඉන්නවා කියන අධිෂ්ඨානයෙන් යුතුව සිටි අය. ඒ නිසා ඉඩම් අත්හැර යාමේ ප්‍රශ්නය බැරෑරුම් ප්‍රශ්නයක් වුනේ නැහැ. නමුත් නොතිබුනේම නැහැ.

අද තත්ත්වය නම් ඊට වඩා වෙනස්. ඉඩම් ලාභියා ගෙදර වෙනත් කටයුතු කරන ගමන් තමන්ගේ නියෝජිතයෙක් ඉඩමේ පදිංචි කරවල ඒ ජනපද ඉඩම වගා කරවනවා. ගොවි මුදලාලිලා තමයි අද දකින්න ඉන්නේ. නියම ගොවියා වගා කරන්න බිමක් නැතිව දුක් විඳිනවා.

මේ සංවර්ධන වැඩ හා සමඟම මැලේරියා මදුරු මර්ධන ව්‍යාපාරයත් එකටම වාගේ දියත් කරල තිබුනා. ක්‍රමයෙන් මැලේරියාව තුරන් වෙලා ගියා. ගොවිතැන් වලින් රට සංවර්ධනය වුනා. මැලේරියාව තුරන් කිරීම සංවර්ධනය පිළිබඳ ජයග්‍රහණයක් ලඟා කර ගැනීමේ මූලාරම්භක පියවර වශයෙන් සලකන්න පුළුවන්. ඒ කාලෙ මේ ජනපදවල ඉඩම් ලාභීන් එහි යාම වැලකීමට තිබුණු විශාලතම හේතුව තමයි මැලේරියාව හා මැලේරියා මදුරු වසංගතය.

මේ හැරුණු විට ඩී. එස්. ගේ පෞද්ගලික ජීවිතය ගත්තත් ඔහු ගොවිතැනට ඉතාමත් ආශා කළ කෙනෙක්. ඔහුගේ කොටුල් වැව කියන ඉඩම සහමුලින්ම විශාල පරිමානයේ ගොවි පොලක්. එහි කුකුළු ගොවිපොලක්, මිරිදිය මාළු ඇති කරන විශාල මාළු ජලාශ, සත්ත්ව ගොවිපොලවල් ආදිය ඇති කරල තිබුණා. ඒ වගේම පළතුරු උයන් වගා කරලා තිබුනා. එළවළු වර්ග වවලා තිබුණා. ඔහුගේ වත්තේ වවා ඇති වට්ටක්කා වැනි ඒවා මිරිදිය මාළු ජලාශවල මසුන්ගේ ආහාර වශයෙන් ලබා දුන්නු අතරම නවතම ක්‍රම ඇසුරෙන් කුකුලන් ඇති කෙරුවා.

ඔහුගේ නාරංගොඩ වත්තත් මේ ආකාරයේම ගොවිපලක්. එතුමා එහි පලතුරු වගාව මහා පරිමානයෙන් කර තිබුනා. එක යායට අක්කර ගණනාවක් රඹුටන් වර්ග කිහිපයක් වගා කරල තිබුනා. එක යායටම කහ පාට රඹුටන් අක්කර 3ක් 4ක්, ඊළඟට ලා රතු පාට අක්කර 5 ක් 6ක් , ඊලඟට තද රතුපාට රඹුටන් අක්කර 5ක් වගේ ක්‍රමානුකූලව වගා කර තිබුනා. එහි මදය පමණක් තිබෙන මැලේසියන් වර්ගයේ රඹුටන් පවා එදා එතුමා වගා කරල තිබුනා. එය හරියටම කියනවා නම් ආදර්ශන ගොවිපොලක් වගේ. එතුමා ඉතා දුරදිග බලල තමයි ඒ වගේ වැඩ එද එහෙම කළේ.

සත්ත්ව පාලනය පිළිබඳව අවධානය යොමු කළා. සතුන් 5000 කින් පමණ සමන්විත රිදියගම සත්ත්ව ගොවිපල එතුමාගේ වැඩක්. එතුමාගේ අවාසනාවන්ත මරණයෙන් පසුව ඩඩ්ලි සේනානායක මහතා ගොවිතැන් කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය පියවරවල් බොහොමයක් ගත්තා.